**ශීර්ෂය 230- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව නීති කෙටුම්පත් සම්පාදක වෙත 2016 සැප්තැම්බර් 13 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 158.65ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 88.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 70.52 ක් හෙවත් සියයට 44.45 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 87.84 | 76.21 | 11.63 | 13.24 |
| මූලධන | 70.81 | 11.92 | 58.89 | 83.17 |
| **එකතුව** | **158.65** | **88.13** | **70.52** | **44.45** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.0 | 1.6 | 1.5 | 2.3 | 19.0 | 9.9 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0138/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 13.99 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.73,135ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000/0000/00/0013/0067/000 | 66,985 |
| 6000/0000/00/0018/0059/000 | 6,150 |
| **එකතුව** | **73,135** |

**2.5 විගණන නිරීක්ෂණය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 කාර්යසාධනය

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

| රාජකාරීයේ ස්වභාවය | 2015 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව | වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලුම් සංඛ්‍යාව | එකතුව | 2015 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් සකස් කර අදාල පාර්ශවයන් වෙත ලබාදුන් සංඛ්‍යාව | 2015 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව | ඉටු කළ යුතුව තිබුණු ප්‍රමාණයෙන් නීති කෙටුම්පත් පිළියෙල කළ සංඛ්‍යාවේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| අණපනත් කෙටුම්පත් කිරීම (මූලික හා සංශෝධන නීති) | 162 | 64 | 226 | 32 | 194 | 14.16 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගේ පෞද්ගලික පනත් | 82 | 12 | 94 | 05 | 89 | 5.32 |
| රෙගුලාසි සංශෝධනය කිරීම (උපකාර නීති) | 124 | 129 | 253 | 129 | 124 | 50.99 |
| පළාත් සභා ප්‍රඥප්ති | 19 | 04 | 23 | - | 23 | නැත |

2015 පැවති මුළු ඉල්ලුම් සංඛ්‍යාවෙන් කෙටුම්පත් කිරීම් අවසන් කර අදාළ පාර්ශවයන් වෙත ලබා දුන් සංඛ්‍යාව සියයට 5 ක සිට සියයට 51 ක් දක්වා පරාසයක පැවතුණු අතර පළාත් සභා ප්‍රඥප්ති කෙටුම්පත් කර අදාළ පාර්ශවයන් වෙත ලබා දී නොතිබුණි.

## 3.2 දේශීය මූල්‍යකරණය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---

### 3.2.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

---

නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 185 ක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ව්‍යාපෘතිය 2013 වර්ෂයේදී ආරම්භ කළ යුතු අතර එය 2017 වර්ෂයේදී නිම කළ යුතුව තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 2.76 ක් වැය කර තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම, දින 100 වැඩසටහනට සම්බන්ධිකරණ නිලධාරීන් ඉවත්වීම නිසා ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

---

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 25 | 12 |
| (ii) | තෘතියික මට්ටම | 28 | 03 | 25 |
| (iii) | ද්විතියික මට්ටම | 62 | 30 | 32 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 24 | 22 | 02 |
| (v) | වෙනත් | 04 | 04 | - |
| | **එකතුව** | **155** | **84** | **71** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2015 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 71 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු 06 ක්, සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු 05 ක් භාෂා පරිවර්තක පුරප්පාඩු 23 ක් සංස්කාරකවරු 08 ක් සහ ලේඛන සහකාර පුරප්පාඩු 13 ක් නිරීක්ෂණය විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි.